# නිර්මාණ Nirmana

## එකම මග !

පියකරු රුවක් දුටු විටකදි ලොබ නොසිතා
නොමිතුරු රුවක් වෙත නැති දුරු කරන සිතා
නොවියරු සිතින් සුමිහිරි හඬ සවන පතා
නොම දුරුකරන සිත අමිහිරි නදක් වෙතා

සිත ඇති නෙතට පසුපස හඹවන සුවඳ
වත මුකුලිත නොකොට සිටිමින් වෙත දුගඳ
ගත පිනවන ලොබින් නොම සුව පහස විඳ
සිත සලවන දොසින් ලද විට දුක නොවිඳ

දිව පිනවන රසට ලැදි බව නොවන සිත
මුව රැදි විරස ගැන වුව සිත නොසල වෙත
නොව ගැති නැගුණු සිත් වෙත ඇතිකරන මත
බව බැඳි රැහැන් මෙලෙදට බිඳ දැමිය යුත

ඇස දුටු දුටු පමණ ඇසූ දෙය ඇසූ පමණ
රස ගඳ පහස සිතුවිලි එපමණට ගෙන
වැස වැද දැහැන සමතට සිත එකඟ වුණ
බැස බවුනට වඩන තිලකුණ මග නිවන

සත අටලෝ දහම් පෙරළී යන නිතර
දුක ගිනි මැද මුලාවුණ කතරරෙහි සසර
දැක මෙලෙසට නියම මග කරවන එතර
සැක දුරුකර විඳිමු සුව අජරා අමර

♦ වෛද්‍ය උපාලි අබේසිරි
Middx UK

## සැනසුම සොයා !

පායන හිරු උදය හවසට බැස යනවා
හිරු බැස යන විටදි අඳුරත් ගෙට එනවා
තිබුණත් හිතේ දොඩවන්නට මොන මොනවා
ඒවා සුළං රැල්ලක පාවී යනවා

දවසක තරුණ කාලය ගතවෙවී යන
රැකගෙන දරු පැටව් සෙනෙහෙන් බදා ගෙන
සැමියා සමග දුක සැප දෙක බෙදා ගෙන
ගතවෙයි ජීවිතය සැනසුම ළඟා වෙන

දහවල රැය දෙකේ දහදුක් විඳින එක
මවකගෙ සතුට වෙයි දරුවන් හදන එක
ඇතිදැඩි වෙලා තම දෙපයින් දුවන එක
මවු හද පිරෙයි දරුවන් සැප විඳිනු දැක

අම්මේ කියා ආදරයෙන් දොඩන හඬ
කිරි කොතලයක් උතුරා බිම හැලෙන හැඩ
මතුකරවයි සතුට හදතුළ නැතිව ඉඩ
සැනසුම ගෙනෙයි මවකට දරුවනගෙ හඬ

කිචි බිචි ගා කුරුළු පැටවුන් හඬ දෙනවා
කිරිලිය වෙහෙස වී බඩ කට පුර වනවා
පියපත් ලැබුණ පැටවුන් ඉගිලී යනවා
කූඩුව පාළුවෙයි ගී හඬ පැතිරෙනවා!

ලෝ දම එකයි කාටත් පොදුබව රකින
තනිවී ගෙදර දූ දරුවන් ගැන හිතන
හදවත් වලට සදහම් රසයෙන් බෙදන
ආසිරි මිහිර පමණකි සැනසුම ගෙනෙන!

♦ ප්‍රේමා එස්. රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## අ-මර

කරට වන් ක්ලේශවල බර දැනේ
කම්කටොළු වූ පිට මැදට
සසරේ ගිරි දුර්ගය නගින
ජීවිතය නම් මරුකතරෙහි
තව කොපමණ දුරක්
යා යුතුදැයි නොදැන.
නොතේරෙන නොහැඟෙන මේ මගෙහි
මෝහයෙන් හදාගත්
කණවැල රැගෙන යමි !
බතක් ඇත - වතක් ඇත
ගෙයක් ඇත - දැයක් ඇත
එහෙත් අසහනයෙන් මිදී
හැකිවෙද මරන්නට
නිරන්තරයෙන් සිටින
දුක්ඛ නම් අ - මර

♦ මාලපල්ලේ
කුමුදු රොහාන් අමරසිංහ
Edmonton - London - UK

## ඔවදනක් !

අතීතයට ගිය හැටි නොසිතනු ඊයේ
අනාගතය හෙට ඔබ වෙත නැත ආයේ
අද ඔබ තුටින් කල්ගෙවතොත් දියදායේ
ජීවිත පොතම රසවත් ලෙස ලියැවී යේ

♦ බලගල්ලේ රංජිත් සිරිවර්ධන



## සුනාමි දුම්රියට නැගුණු තරුණිය

දිය යට කිමිද මුතු බෙල්ලන් සොයන සඳ
සිහියට නොඑද ඔබෙ මුතුකැට සිනහ පොද
උදයට දැනෙන පින්නේ පිපි සුවඳ කොද
සැමවිට තබයි මගෙ සිත ඔබ වෙතම බැඳ

නිල්දිය කපා මින්ගම එළිකළ දිනිඳු
අතගෑ පත්ල පට සේලෙට වැඩි සිනිඳු
බුර බුර නැගෙන රළ යකුගෙන් බොර විනිඳු
දහසක් නෙත් පියා හැඬුවද සක් රපිඳු

දුම්රිය කවුළුවෙන් දුන් හසරැල් සොබනා
සොරකම් කළේ කවුරුන්දැයි මා නොදැනා
අමතක නොවේ කිසිදා ඔබ යළි නොඑනා
මේ අත්බවේ නිමවෙද දුක් මා විඳිනා

♦ අනුර හෑගොඩ London

## අම්මා



සණ අඳුරු අහස් ගැබ
බබලමින් දිස්නෙ දෙන
තරු රැණ එළිය කළ
සඳ මඬල නුඹම විය

අතුපතර විහිද ගිය
මලින් සරු පලින් බර
මහ ගසට සවිය දුන්
මුදුන් මුල නුඹම විය

විටින් විට අව් වැස්ස
විටෙක එන මහ මේඝ
නොතකමින් නොසෙල්වුණ
මහමෙර ද නුඹම විය

පැටව් ටික වටකරන්
යහ අයහ දම් මෙයයි
දියෙන් කිරි වෙනුකෙරූ
හංස ධේනුව නුඹ ය !

♦ ප්‍රදීපා වික්‍රමසිංහ London SW19

## පාඨක ලේඛක ඔබට

කවියට කලාවට නිති අත හිත දෙන්ට
මෙම කවි පිටුව වෙන්වෙයි පාඨක යන්ට
සිතුවිලි ලියා හැකි පමණින් කෙටි වෙන්ට
අප වෙත එවනු මැන කාටත් කිය වන්ට

## සසර බැඳීම්

යසෝධරා නිවුණා
සුජාතාව නිවුණා
විශාකාව නිවුණා
කිසාගෝතමී නිවුණා

දියණිය ලෙස ඉපදී
මුරකාවල් තුළ සිරවී
සංතෝෂය අහිමී
සසර දුකකි සිතුනී

ආදර බිරිඳ වෙලා
හිමි සිත සනසාලා
කුලගෙයි රැජිණ වෙලා
සසරට තව බැඳිලා

දසමස කුස රැකලා
දරුවන් බිහිකරලා
ඔවුනට මව වීලා
සසරට තව වෙළිලා

දියණිය බිරිඳක
මවක වෙලා
ආලය දන් දුන්නා
නැතිවී ඉඩකඩ
ශීල භාවනා
සසරට තව බැඳුණා

කුමාරි විජේරත්න
Hounslow UK



## උණ පඳුර

ගං දැල මැද සොඳින
වියපත් පඳුරු මැදිකර
මඳ සුළඟ වැද නැළැවෙන
උණපඳුර නැත වියපත්

වෙල්යාය අස දෙපසින
පිනි පිරුණු තණපත් අතරින
රළු සුළඟටද හිනැහෙන
කරයි තුන් සිත සුවපත්

ගෙන ඇසට රසඳුන්
ප්‍රමෝදය දී බැතියෙන්
සිසිල දී රස හොවමිනි
උණපඳුර හිනැහේය විළියෙන්

♦ අචිනි කල්හාරි
ලියනදුර
දියපරදුව නවදගල
Sri Lanka

## කන්නලව්ව !

වැව් විස්සක් බදු දෙන්නට යන වාලූ
,ජල කළමනා කරණෙන්,එය සිදු වේලූ
ලබ්බට තිබ්බ අත පුහුලට ළං වේලූ
අනික් ඒවා පසුවට සලකන වාලූ

සංචාරකයො එනවලු මහ ගොඩක් රටින්
ඒ අය පිනවන්න සකසා තබන අටින්
වැව්වල සියළු ජලක්‍රීඩා මවන තුටින්
ලැබෙන මුදල් කොහි යාවිද අතට යටින්

වැව්වල වතුර මට්ටම අඩු නොවිය යුතූ
බදුගත් අයගෙ කොන්දේසිය රැකිය යුතූ
කෙත්වතු පාළු වෙනවද නැද්ද ගත යුතූ
කරුණක් නොවෙලු මුදලයි මෙහිදි බල ගතූ

කන්දේ සිටින නයිදේටයි කියන් නේ
වැව් ටික ඔහොම විකුණාගෙන නොකන් නේ
වතුර නොලැබුණොත් යල මහ දෙකන් නේ
රටෙන් බාගයක් හාමතෙ මැරෙන් නේ

සංහිඳගාව කෙම්මුර දිනක බිය කරූ
ඔප්පුකර යදිමි බැතියෙන් පුද පඬුරූ
නැව් විකුණන් කන්න අරඅදින පල් හොරූ
කඩවර දෙවියනේ සහමුලින් දුරු කරූ

♦ කාන්ති සුනිතා පෙරේරා
London NW9

## වියැකුණු සෙනෙහස

පින්න ඉහිරුණු මලක සෙනෙහස
කියයි දොඩමළු දැස් හෙමිහිට
දරා සීතල නොදැක නුඹෙ රුව
හදාගන්නට බෑ මගේ හිත

දමා ගසමින් සිනා මල්පෙති
කුමට විහිදා ගත්තෙ අතු ඉති
සෙවන දී මට පලායත්නම්
ඇහුවෙ ඇයි ආදරය ගැන නුඹ

වැටී කළුවර හාත්පස හැම
නොපෙනෙනා විට අවුත් එළියට
කුමට ගොළුකරගන්නෙ සෙනෙහස
තුරුළු වී අපි ඉදිමු අද රෑ

♦ චම්පිකා නිරෝෂණී
මාරපන රත්නපුර Sri Lanka

## සුනරුත් පැතුම්

දල්වා දෑසේ පහන් - බලා සිටියා මම
අඳුරු අගාධයක් එකළු කරනට
හිරු නැගෙන ලෝකයක්......

දෙසවනේ අගුල්පත් - හැර දැමුවා මම
අසන්නට රිසියෙන් - කුරුළු හඬ පරදනා
මිහිරි සංගීතයක්......

හදවතේ පියන්පත් - විවරකෙරුවා මම
ලැගුම්ගන්නට සදා - ගුණ සුවඳ පතුරණ
සමන් මල් පියල්ලක්......

ආදරයේ නාමයෙන් - එක්කලා දෑත මම
ගොතන්නට සෙනෙහසේ
චමත්කාරය ගෙනෙන
සොඳුරු මල්දමක්......

සිතු සිතුමන් - පැතු පැතුමන්
මහා මිරිඟුවක් වී - පෙලයි අද මගේ හද
පාළුවත් තනිකමත් හදවතේ වපුරලා......

ආදර සෙනෙහසක - සිසිලසක් නොලද හද
ඉකිබිඳින හඬ ඇසෙයි - පෙලා දෙසවන අද
වියරු වූ සාගරයේ - රුදුරු හඬ පරදලා....

♦ මොරින් සී. පෙරේරා
London W11

## ලක්මව් වරුණ

සහරා කතරෙ තනිවී දිවි ගෙවන විට
සිහියට නැගෙනවා සුන්දර මගේ රට
ඉපදුන දේශයේ අසිරිය මෙනෙහි කොට
සිතුවිලි මගේ ගොනු කරනෙමි කවිය කට

ඇළ දොළ නොමැති මහ පොළවද වියැළී ලා
ගහ කොළ හිහයි යයි ගිනි සුළඟක් හම ලා
කහවනු සොයනු වස් සිටියට පයගහ ලා
දැනුනා අගේ මව්බිම ගැන වැඩි වී ලා

අපේ හෙළ උරුමයේ ඇත්තේ සංස්කෘති යක්
තිබෙනා සිරිත් හා ඇගැයුම් එක සිය යක්
සංකර ලොවේ තිබුණත් ඔවුනට අග යක්
දුටුවේ නැත තිබෙන ඒ එක හොඳ ගති යක්

ගුණදම් පිරුණු මගෙ සිරිළක් වැසියන් නේ
සංකර ලොවේ පැහැදීමෙන් හිඳපන් නේ
ඇන්දට පැළැන්දට දෙඩුවට නවපන් න්
යනවිට මව්බිමට සැම අත් හැරපන් නේ

♦ විමලා යාපා -සයිප්‍රස් සිට Cyprus

## කහ ඉර

කළඹා හැඟුම් පිරිමැද ඉපදෙන මායා
සිහිනෙක සතපවා හද ඇඳි රූ ඡායා
ඉරණම් ගමන යනවිට මධුසඳ පායා
දෙපසේ මල් පිපී ලොව පාමුල සේයා

යුවළ දෑත් පටලා කහ ඉර ළඟදී
දෙපස පිරික්සා සිහි නුවණින් පැහැදී
තරණය කළද කඩඉම සෙනෙහෙන් ළබැඳී
පැනගත් පිරිස සමහරු තරහය පරදී

සොමිසඳ ලෙසට හැඩරුව දිලුනත් කදිම
පැහී නොමැත අදහස් සිතුවිලි උරුම
දැනුවත් නොවී පැන්නොත් කහ ඉර තරම
ආබාධිතය පණ නළ සැඟවෙන තුරුම

බඹා කෙටූ හැටියට කහ ඉර පනිතී
මගදිම සමහරුන් හති දමමින් නවතී
තව අය ගිහිගෙයක ගිනිදළු මැද නවතී
හිතින් බැඳුණු පෙම්දම් නොසැලී පවතී

♦ පද්මා කුරුප්පු Paris - France



## ළඟ සිටියත් මට ඈතයි

ගිරි මුදුනෙන් පායන හිරු මට ඈතයි
අඹරෙ සුදිලෙනා පුන් සඳ මට ඈතයි
සප්ත වර්ණ දේදුන්නත් මට ඈතයි
මහද අරණෙ ආදර ඔබ මට ඈතයි

මග යනෙනා විට දහසක් නෙත් ගැටෙනා
ඒ නෙත් දකින විට මා හට සැක සිතෙනා
එදෙස නොබලනා සිත ඔබ වෙත ඇදෙනා
ඔබ සිප ගැනීමට මා සිත ලොබ බඳිනා

ඔබ මතකය පවා මා මනදොළ පිරෙනා
ස්වරය ඔබේ සොඳුරුයි දෙසවන් පිනනා
පහස ඔබේ සුමුදුයි දෙකොපුල සිඹිනා
ඔබ වැනි අයෙක් නොදුටිමි ආදර වඩනා

මද නල රැගෙන එන්නේ ඔබගේ සුවඳයි
අන් හැම සුවඳ ඔබගේ සුවඳට පරදියි
මද හසරැල්ල ඔබගේ වත නිති සරසයි
මගෙ දුක් සුසුම් ඒ හසරැල්ලෙන් පහවෙයි

♦ මේනු පෙරේරා
Ilford Essex UK

## Thinking

" Today I went to class
I did nothing but stare and wonder
About all my toil and timber

I thought about what you did to me
I thought about how it came to be
I felt so lonely at the time
I felt like I didn't have a dime

Now I'm musing what to do
Knowing I will always think of you."

♦ *GARY R. HESS*

## ග්‍රීෂ්මානයේ දී

ගිරිකුසෙක ජනිත කඳුරින්
තැනි බිමෙක සිසිල සදමින්
ගංදියෙක කිමිද නහමින්
ගිම් නිවමි තැවුල දොවමින්

වැහි කඳුළ සැලූ මෙතරම්
නුබ අඟන කොපුල මනරම්
මීදුමෙක නොදිසී නිම්හිම්
සීතල ද සිත ද උණුසුම්

රළු පවන පවා සැණෙකින්
මල් සුවඳ විඳින විලසින්
කටු තුඩෙක ඇනුණු දිවියෙන්
දුක තුළම රැඳෙමි සතුටින්

♦ සරත්චන්ද්‍ර බණ්ඩාර Sri Lanka